ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026.03.23 |

පැමිණිලිකරු - එච්.එම්.කේ.හේරත් මිය,
අංක - 15, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.

වින්දිත - එච්.එම්.ටී.එන්.උපුල්දෙණිය,
අංක - 15, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,කොළඹ 07

වගඋත්තරකරුවන් - 01. අධ්‍යක්ෂ,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

02. ලේකම්,
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
කොළඹ 10.

**පැමිණිලි අංක - එච්.ආර්.සී/1803/25**

පැමිණිලිකාර පාර්ශවය 2025.06.16 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ 2025.05.12 වන දින වෙසක් පෝය දිනට අදාළව අනුරාධපුර බන්ධනාගාරයේ සිරකරුවෙකු නිදහස් කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සිදුකරන ලද පැමිණිල්ලක් අනුව තමාගේ ස්වාමිපුරුෂයා වන එච්.එම්.ටී.එන්.උපුල්දෙණිය (වින්දිත පාර්ශවය) 2025.06.09 වන දින අනීතිකව අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන ප්‍රශ්න කිරීමෙන් අනතුරුව 2025.06.10 වන දින අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්ය.

පසුව 2 වන වගඋත්තරකරු විසින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ලෙස සේවය කළ තමාගේ ස්වාමිපුරුෂයා නීති විරෝධී ලෙස වැඩතහනමකට ලක් කර ඔහු සේවය කළ තනතුරින් සිතාමතා සාධාරණ හේතුවක් නොමැතිව චේතනාන්විතව ඉවත් කිරීමට කටයුතු කළ බවත් මේ හේතුවෙන් ස්වාමිපුරුෂයාටත් තමාටත් දරුවන්ට හා පවුල්වල අයට අගතියක් හා අපහාසයක් වූ මේ හේතුවෙන් බවත් මේ හේතුවෙන් වින්දිතගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත් පැමිණිලිකාරිය විසින් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman — 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail — sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary — 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

**<u>වින්දිතගේ කරුණු දැක්වීම :-</u>**

තමා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ලෙස සේවය කරමින් සිටි බවත් 2025.05.12 වන දින ජනාධිපතිතුමා විසින් (වෙසක් පොහොය දිනය නිමිත්තෙන්) බන්ධනාගාර සිරකරුවන් වෙත පිරිනමන ලද පොදු සමාවට අදාළව අනුරාධපුර බන්ධනාගාරයේ රැඳවියෙක් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2025.06.09 වන දින තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, එදිනම තමා වැඩ තහනමකට ලක් කළ බවත් වින්දිත පාර්ශවය දක්වා සිටියි.

2025.05.12 වන දින වෙසක් පොහොය දිනය නිමිත්තෙන් ජනාධිපති පොදු සමාව යටතේ නිදහස් කිරීමට යෝජිත සිරකරුවන්ගේ නාම ලේඛනයක් බන්ධනාගාරය විසින් සකස්කර තිබූ බවත් එකී නාම ලේඛනයේ සඳහන් සිරකරුවන් 388 දෙනාට පමණක් සමාව ලබාදෙන ලෙස මෙවර ජනාධිපති කාර්යාලය මගින් දන්වා තිබුනු බවත් ඒ අනුව යෝජිත ලැයිස්තුවේ නොමැති සිරකරුවෙකු නිදහස් කිරීම පිළිබඳව ජනමාධ්‍ය මගින් ප්‍රචාරය වීම මත ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් විසින් මූලික විමර්ශනයකින් තොරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩිනමින් විමර්ශනයක් ආරම්භ කළ බවත් ඊට අදාළව තමාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව 2025.06.07, 2025.06.08 ප්‍රකාශ ගත් බවත් 2025.06.08 දින ප්‍රකාශ ලබා ගැනීමෙන් පසු තමා අත්අඩංගුවට ගන්නා බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැන්වූ නමුත් පසුව අපරාධ චෝදනා නැගිය නොහැකි බව පවසා තමාව මුදාහැරිය බවත් නැවත 2025.06.09 වන දින ප්‍රකාශ ලබා ගැනීමට කැඳවා එදිනම අත්අඩංගුවට ගෙන 2025.06.10 දින මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

තමා අමාත්‍යාංශ ලේකම් වෙත ව්‍යාජ ලේඛනයක් සකස් කර ඉදිරිපත් කර විශාල වංචාවක් සිදුකර ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු දැක්වූ බවත් ඒ අනුව 2025.06.11 දින දක්වා තමා රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් 2025.06.11 දින නැවත නඩුව කැඳවූ අවස්ථාවේදී තමා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන විමර්ශන වලට බාධා සිදුකල හැකි බවට ඔවුන් කරුණු දැක්වීම හේතුවෙන් නැවත දින 14 ක කාලයක් සඳහා තමා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද බවත් වින්දිත පාර්ශවය විසින් දක්වා ඇත. 2025.06.24 නැවත නඩුව කැඳවූ අවස්ථාවේදී මිල්රෝයි ප්‍රනාන්දු නැමැති හිටපු අමාත්‍යවරයෙකුගේ බිරිඳට සමාව ලබාදීම පිළිබඳව ප්‍රශ්න සහගත තත්ත්වයක් ඇති බවත්, එවන් බොහෝ දේ ඇති බවත්, එම කරුණු සොයා බැලීම කළයුතු බවත් පවසමින් ඇප ලබාදීමට විරුද්ධවීම හේතුවෙන් නැවත තමා බන්ධනාගාර ගත කළ බවත්, උක්ත අමාත්‍යවරයාගේ සිදුවීම සිදුවූයේ තම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ලෙස පත් වීමට බොහෝ කලකට ඉහතදී වුවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් හා රජයේ අධිනීතිඥවරයා ඒ පිළිබඳව දැනුවත් වුවද කුමන්ත්‍රනකාරී ලෙස තමාව රක්ෂිත බන්ධනාගාරගත කිරීමට පාර්ශවයන්ගේ අවශ්‍යතාවය අනුව කටයුතු කළ බවත් වින්දිත පාර්ශවය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

පසුව තමාට 2025.07.09 වන දින ඇප ලබාදුන් බවත්, ඒ අනුව කිසිදු අපරාධ වරදක් සිදුකර නොමැති තමා 2025.06.10 දින සිට 2025.07.09 දින දක්වා දින 29 ක කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් වින්දිත විසින් දක්වා ඇත.

තවද මේ සැබැදිව 2025.06.09 වන දින කිසිදු මූලික විමර්ශනයකින් තොරව තමාගේ රාජකාරි වැඩතහනම් කළ බවත්, ඒ බවට ලිපියක් මගින් දැනුම් දුන් බවත් විශේෂයෙන්ම මෙම ප්‍රශ්න ගත සිදුවීම පිළිබඳව කටයුතු කිරීමේදි ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ ප්‍රධානීන්ගේ සහ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැසිරීම් ප්‍රශ්න සහගත වු බවත්, සත්‍ය සිදුවීම අනාවරණය වි තිබියදි කිසිදු සාධාරණ හේතුවකින් තොරව තමාට අපරාධ චෝදනා එල්ල කිරීම තුළින් මේ වන විටත් තමාට සහ තමාගේ පවුලේ අයවලුන්ට විශාල හානියක් සිදුවි ඇති බවත්, මේ ආකාරයට තමාට වැඩතහනම් කර ඉන් නොනැවති අසත්‍ය හා පදනම් විරහිත චෝදනාවලට සැකකරමින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම යම්කිසි අනිසි දේශපාලන හෝ වෙනත් බලපෑමක් මත සිදුවුවාද යන්න හා තමා එම තනතුරෙන් ඉවත් කිරීමට කරන ලද කටයුත්තක්ද යන්න පිළිබඳව තමාට සාධාරණ සැකයක් ඇති බවත් වින්දිත විසින් දක්වා ඇත.

උක්ත පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වින්දිතගේ ප්‍රකාශ 2025.06.17 දින සටහන් කර ඇති අතර, 01 වන හා 02 වන වගඋත්තරකාර පාර්ශවය වෙතින් පිළිවෙලින් 2025.06.19 හා 2025.06.18 වන දින වාර්තා කැඳවා ඇති අතර, 2025.07.18 වන දින හා 2025.07.23 දින අදාළ සියලු පාර්ශවයන් කැඳවා පරීක්ෂණ පවත්වා ඇත. වැඩිදුර වාර්තා 2025.07.28, 2025.08.05 වන දින කැඳවා ඇත.

<u>01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-</u>

01 වන වගඋත්තරකරු විසින් අංක - PA/DCI/fd/882/25 සහ 2025.07 දින රහිතව ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව ජනාධිපති පොදු සමාව අවභාවිත කරමින් බන්ධනාගාර රැඳවියන් අනිතික ලෙස නිදහස් කිරීම සම්බන්ධයෙන් 2025.06.06 දිනැතිව ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්තුමා විසින් යොමුකරන ලද ලිඛිත පැමිණිල්ලකට අදාළව විමර්ශනයක් සිදු කළ බවත්, මෙකි විමර්ශනයේදි තහවුරු වි ඇති සාක්ෂි මත හේරත් මුදියන්සේලාගේ තුෂාර උපුල්දෙණිය යන අය 2025.06.09 දිනැතිව සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගෙන කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් නඩු අංක බී 48224/01/2025 යටතේ අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2025.07.09 දක්වා රක්ෂිතබන්ධනාගාර ගත කර ඇති බවත් අත්අඩංගුවට ගැනීමට හේතුව ජනාධිපති පොදු සමාව ලබාදුන් බවට අසත්‍ය සටහන් යොදා නිදහස් කළ බන්ධනාගාර ගත රැඳවියන් සම්බන්ධයෙන් අසත්‍ය ලේඛන අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම හා ඉහත වරද සිදුකිරීමට බන්ධනාගාර අධිකාරිවරුන්ට ආධාර අනුබල දීම බවත් දක්වා ඇත.

ඒවා දණ්ඩ නීති සංග්‍රහ පනතේ 452, 453, 100 සමග කියවිය යුතු 457 වගන්තිය හා 163, 193, 197 වගන්ති යටතේ වන වැරදි බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**02 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

02 වන වගඋත්තරකරු විසින් අංක - MOJ/Prison Ad/Ad-II/01/03/මානව හිමිකම් කොමිෂන් සභාව සහ 2025.06.23 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් වෙසක් පොහොය දිනට සමගාමීව "ජනාධිපති පොදු සමාව යටතේ බන්ධනාගාර රැඳවියන් නිදහස් කිරීමේ ක්‍රියාවලිය තුළ පැන නැගී ඇති ගැටලු" යන මැයෙන් 2025.06.09 දිනැති 25/0985/818/062 අංක; ලිපියෙන් දන්වා එවන ලද අමාත්‍ය මණ්ඩල තිරණය ප්‍රකාරව ආයතන සංග්‍රහයේ 11 වෙනි කාන්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31:5:1 හි සඳහන් විධිවිධානු සැලකිල්ලට ගනිමින් වහාම ක්‍රියාත්මක වන පරිදි බන්ධනාගාර කොමසාරිස් ජනරාල් එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය මහතාගේ රාජකාරි වැඩ තහනම් කල බවත්,

2025.05.09 දිනැති ලිපියෙන් බන්ධනාගාර කොමසාරිස් මෙහෙයුම් විසින් වෙසක් දිනයට නිදහස් කිරීමට සුදුසුකම් ලත් රැඳවියන් 388 කගේ නම් යෝජනා කරමින් ලැයිස්තුවක් ඉදිරිපත් කොට තිබුනු බවත් ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාවෙන් පැවරි ඇති බලතල ප්‍රකාරව එකී යෝජිත ලැයිස්තුවෙහි සඳහන් රැඳවියන් 388 දෙනාට ජනාධිපති පොදු සමාව (General Amnesty) ලබාදෙනු ලබන බවට ජනාධිපති ලේකම්ගේ 2025.05.09 දිනැති PS/CSA/00/09/IX/01/03 ලෙස අංකිත ලිපියෙන් තමා වෙත දන්වා එවු බවත්, එම ලිපියෙහි ඇතුලත් වූ කොන්දේසියක් වූයේ මෙකි ජනාධිපති පොදු සමාව ලබාදීමට එකී රැඳවියන් 2025.05.05 වන දින වන විට බන්ධනාගාරය තුළ සිටිය යුතු බවත් සඳහන් කර ඇත.

මෙම අමාත්‍යාංශය ජනමාධ්‍ය තුළින් දැනුවත් වූ පරිදි අනුරාධපුර මහාධිකරණයේ නඩු අංක H.C 69/2018 යටතේ 2025.05.02 දින දණ්ඩ නීති සංග්‍රහයේ 386 වන වගන්තියේ සඳහන් "සාපරාධි සාවද්‍ය පරිහරණය (Criminal Misappropriation) යන වරද යටතේ වරදකරු වි දඩුවම් ලැබ් රැඳවියෙකු මෙකි ප්‍රස්තුත සමාව යටතේ නිදහස් කර ඇත. ඒ අනුව එම හෙළිදරව්වට සමගාමීව බන්ධනාගාර කොමාසරිස් (මෙහෙයුම්) විසින් සිය 2025.05.06 දිනැති ලිපිය සමඟ යොමු කළ ඇමුණුමේ හෝ රැඳවියන් නිදහස් කිරීමෙන් පසුව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් උපුල්දෙනිය මහතා විසින් අදාළ සමාව යටතේ නිදහස් කරන ලද බවට වාර්තා කරමින් තමා වෙත 2025.05.14 දාතමින් යොමු කළ ලිපිය සමග වූ ඇමුණුමේ එම රැඳවියාගේ නම සඳහන් නොවන බවට නිරීක්ෂණය වූ බවත් 2 වන වගඋත්තරකරු සිය වාර්තාව මගින් දක්වා ඇත.

කරුණු එසේ පවතින පසුබිමක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ලෙසට කටයුතු කළ එච්.එම්.ටී.එන්.උපුල්දෙණිය මහතා 2026.06.06 දිනැති ලිපිය මගින් තමා දැනුවත් කරනු ලැබුවේ මෙකි රැඳවුම්කරු සැබැදිව ජනාධිපති පොදු සමාව ප්‍රධානය සඳහා වූ 2025.05.05 දිනට බන්ධනාගාර ගතව සිටිම හා ල.ද.ස 386 වගන්තිය අනුව සමා අභිමි චෝදනා යටතට නොගැනෙන චෝදනාවක් වීම හේතුවෙන් රු.200,000/- දඩ මුදල නොගෙවිම මත අනුරාධපුර මහාධිකරණය මගින් නියම වූ මාස 06 ක සිර දඩුවම අහෝසි කර ඇති බවයි. ඒ අනුව

එදිනට මෙම ස්ථාවරය පැහැදිලි කරමින් මාධ්‍ය ප්‍රකාශයක්ද නිකුත් කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා පියවර ගෙන ඇති බවත්ය.

මෙම සිද්ධිමය කරුණු මගින් තහවුරු වනුයේ 2025.05.02 දින දඬුවම් ලැබූ රැඳවියාගේ දඬුවම අහෝසි කර බන්ධනාගාරයෙන් නිදහස් කිරීමට "ගරු ජනාධිපතිවරයා විසින් 2025 වෙසක් පොහෝය වෙනුවෙන් ලබාදෙන සමාව" පදනම් කොට ගෙන තිබූ බවත්, එම ස්ථාවරය බන්ධනාගාර කොමසාරිස් මැනවින් අනුමත සහ තහවුරු කරනු ලැබූ තිබූ බවත්ය.

එහෙත් ඇමුණුම් වල මෙම රැඳවියාගේ නම නැති බව ලේඛනගත සාක්ෂි මගින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් උපුල්දෙනිය මහතා විසින් ගනු ලබන ස්ථාවරය තහවුරු කරනු නොලබන බව පැහැදිලි වූ බව වැඩිදුරටත් දක්වා ඇත.

තවද රැඳවියා නිදහස් කිරීම පිළිබඳ පැහැදිලි කරමින් 2025.06.06 දාතමින් ලිපියක් තම අමාත්‍යාංශය වෙත එවීමට පෙර සහ විෂයගත රැඳවුම්කරුගේ නිදහස් කිරීම සාධාරණී කරණය කරමින් මාධ්‍ය නිවේදනයක් මහජනතාව වෙත නිකුත් කිරීමට පෙර මූලික පියවරක් ලෙසට සිදුකල යුතුව තිබුනේ තමන්ගේම අත්සනින් 2025.05.14 දිනැතිව අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කොට තිබුනු ජනාධිපතිවරයා විසින් 2025 වෙසක් පොහොය දිනය නිමිති කොට ගෙන ප්‍රදානය කරන ලද සමාව ලබාදුන් රැඳවියන්ගේ නාමලේඛනයෙහි විෂයගත රැඳවියාගේ නම ඇතුලත්

වේදැයි පරීක්ෂා කොට තහවුරු කර ගැනීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් උපුල්දෙනිය මහතා විසින් අපොහොසත් වී ඇති බව පැහැදිලි වූ බවත් ඔහු විසින් ඒ පිළිබඳ පරීක්ෂා කිරීමක් සිදුකලේ නම් තමන් විසින් අත්සන් යොදා 2025.05.14 දින අධිකරණ ලේකම්වරයා වෙත යවන ලද ලිපියෙහි එම රැඳවියාගේ නම නොමැති බවට පැහැදිලිවම උපුල්දෙනිය මහතාට අනාවරණය මෙන්ම අවබෝධයද විය යුතුව තිබුනු බවත් දක්වා ඇත.

ඉහත දක්වන ලද කරුණු සලකා බැලුවිට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ලෙස මෙම සිද්ධියේදි තුෂාර උපුල්දෙනිය මහතාගේ ක්‍රියාකිරීමේ නොසැලකිලිමත්භාවය පැහැදිලි වූ බවත් එසේ නොසැලකිලිමත්ව ක්‍රියා කිරිම මගින් උපුල්දෙනිය මහතා රාජ්‍ය නිලධාරියෙකු ලෙසට ,රාජ්‍ය සේවය අපකීර්තියට භාජන කර ඇති බවත් මෙය ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ 1 උප ලේඛනය යටතේ වන වරදක් වන බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් දක්වා ඇත.

ඒ අනුව මෙවන් පසුබිමක තවදුරටත් පෙන්වා ඇත්තේ 2024 නත්තල් දිනය වෙනුවෙන් ජනාධිපතිතුමා විසින් රැඳවියන් 332 කට පොදු සමාව ලබාදී තිබූ අවස්ථාවේදි සංඛ්‍යාව ඉක්මවා යමින් රැඳවියන් 389 ක් නිදහස් කිරීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරිමක් ද මෙම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වන උපුල්දෙනිය මහතා

වෙතින් කැඳවා තිබූ බවත්, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වන උපුල්දෙනිය මහතාගේ වැඩ තහනම් කිරීම ඉහත සඳහන් කරුණු මත සිදුකර ඇති බවත් වැඩිදුරටත් 02 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

**විශ්ලේෂණය :-**

පැමිණිලිකාර පාර්ශවය මූලිකවම කොමිෂන් සභාවේ අවධානය යොමු කරනුයේ වින්දිත තැනැත්තා වන එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය යන අය නිතියේ දක්වා ඇති කාර්ය පටිපාටියෙන් බැහැරව 2025.06.09 වන දින අත්අඩංගුවට ගැනීම තුළින් වින්දිතගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි.

ඒ අනුව අත්අඩංගුවට ගැනීම නිතියේ දක්වා ඇති කාර්යය පටිපාටිය අනුව සිදුකර තිබේද යන්න සලකා බැලීමේදී අත්අඩංගුවට ගැනීමට අදාළව නීතියේ නියමකර ඇති කාර්ය පටිපාටිය යනු 1979 අංක 15 දරණ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනත මගින් දක්වා ඇති කාර්ය පටිපාටිය වේ. ඒ අනුව මෙම වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලද පැමිණිල්ලකට බව 01 වන වගඋත්තරකාර පාර්ශවය කරුණු දක්වා ඇති අතර, 1979 අංක 15 අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනත යටතේ සංඥය වරදක් සම්බන්ධව අත්අඩංගුවට ගැනීම සැබැදිව 32(ආ) වගන්තිය මගින් ප්‍රතිපාදන දක්වා ඇත.

යම් සංඥය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධවූ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබි තිබේ නම් නැතහොත් ඒ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබි තිබේද නැතහොත් ඒ බවට යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතිද එවිට වරෙන්තුවක් නොමැතිව සාම නිලධාරියෙකුට සිර භාරයට ගත හැකි බව එකී වගන්තිය මගින් දක්වා ඇත.

එහිදි 01 වන වගඋත්තරකාර පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට දින රහිතව 2025 ජූලි මස යොමුකර ඇති වාර්තාවට අනුව දක්වා ඇත්තේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් 2025.06.06 දිනැතිව සිදුකළ ලිඛිත පැමිණිල්ලකට අදාළව විමර්ශනය කර, එම විමර්ශනයේදි තහවුරු වී ඇති සාක්ෂි මත වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගත් බවයි. එම වාර්තාවේ අත්අඩංගුවට ගැනීමට හේතුව ලෙස දක්වා ඇත්තේ,

ජනාධිපති පොදු සමාව ලබාදුන් බවට අසත්‍ය සටහන් යොදා නිදහස් කළ බන්ධනාගාර ගත රැඳවියන් සම්බන්ධයෙන් අසත්‍ය ලේඛන අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම හා ඉහත වරද සිදුකිරිමට බන්ධනාගාර අධිකාරිවරුන්ට ආධාර අනුබලදීම එහිදි දණ්ඩ නීති සංග්‍රහ පනතේ

452 - කූට ලේඛන සැදීම

453 - අසත්‍ය ලේඛන සැදීම

163 - පාඩු කිරීමේ අදහසින් සාවද්‍ය ලේඛනයක් රජයේ සේවකයෙකු විසින් සකස් කරනු ලැබීම

196 - සාක්ෂි වශයෙන් නීතිය අනුව පිළිගත හැකි යම් නිවේදනය කරනු ලැබූ අසත්‍ය ප්‍රකාශය

197 - අසත්‍ය බව දන්නා වූ එබඳු නිවේදනයක් පාවිච්චි කිරීම.

457 - වංචා කිරීමේ අදහසින් කූට ලේඛන සැදීම සඳහා අනුබල දීම 100 සමඟ කියවිය යුතුය. යන යන වැරදි සිදුකළ බවට වාර්තාවේ දක්වා ඇත.

මීට අදාළව 01 වන වගඋත්තරකාර පාර්ශවය සඳහන් කරනු ලබන, ලබාදුන් මුල් පැමිණිල්ල පිළිබඳව අවධානය යොමු කිරීමේදී එම පැමිණිල්ල මගින් දක්වා ඇත්තේ, ජනාධිපති විසින් ලබාදෙන පොදු සමාව හිමි නොවූ පුද්ගලයකු පොදු සමාව යටතේ නිදහස් කිරීම බරපතල වරදක් වන බැවින් ඒ පිළිබඳව ඉතා ඉක්මනින් අදාළ පරීක්ෂණ පවත්වා ඊට අදාළ කටයුතු කරන ලෙසයි. ඒ අනුව මූලිකවම පැමිණිල්ල සිදුකර ඇත්තේ පොදු සමාව හිමි නොවූ පුද්ගලයෙකුට පොදු සමාව ලබාදීම පිළිබඳ පරීක්ෂණය පවත්වන ලෙසයි.

ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළව විමර්ශනයක් පැවැත්වූ බවට 01 වන වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටින අතර, ඊට අදාළව කොමිෂන් සභාවට 01 වන වගඋත්තරකාර පාර්ශවය ලබාදෙන ලද විමර්ශන වාර්තාව අධ්‍යානයේදී ඉහත කාරණය සම්බන්ධයෙන් අනුරාධපුර බන්ධනාගාර අධිකාරිවරයා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු එකී ක්‍රියවලියට ආධාර අනුබල දෙමින් 2025.06.06 දිනැතිව රුදවියා ජනාධිපති සමාව යටතේ නිදහස් කරන ලද සැකකරුවෙකු ලෙස හුවා දක්වමින් 2025.06.06 දිනැතිව සකස් කරන ලද ලිපිය 2 වන වගඋත්තරකාර පාර්ශවය වෙත යොමු කිරීම හා මේ ආකාරයට මීට පෙරද සිරකරුවන් අවසරයකින් හා අනුමැතියකින් තොරව අධිකරණ නියෝග මත සිරදඬුවම නියම කර ඇති සිරකරුවන් බන්ධනාගාරය තුළින් නිදහස් කිරීම හා ඊට අදාළ ආයතනවලට ලේඛන සකස් කරමින් ආධාර අනුබල දීම මත වින්දිත තැනැත්තා වන තුෂාර උපුල්දෙනිය අත්අඩංගුට ගත් බවට කරුණු දක්වා ඇත.

ඒ අනුව වින්දිත අත්අඩංගුවට ගැනීමට හේතු වූ කරුණු ලෙස 01 වන වගඋත්තරකාර පාර්ශවය දක්වනුයේ,

01. ජනාධිපති සමාව යටතේ නිදහස් කරන ලද රුදවියෙකු ලෙස හුවා දක්වමින් අසත්‍ය කරුණු සහිත ලිපියක් යොමු කිරීම.

02. මීට පෙරද සිරකරුවන් අවසරයකින් හා අනුමැතියකින් තොරව බන්ධනාගාරය තුළින් නිදහස් කිරීම.

03. ඊට අදාළ ආයතන ලේඛන සකස් කරමින් ආධාර අනුබල දීමත්ය.

මෙහිදි අත්අඩංගුවට ගැනීමට අදාළව විමර්ශනයකින් එම කරුණු වලට අත්අඩංගුවට ගත්තාද යන්න සලකා බැලීමේදී ඊට අදාළ සාක්ෂි ලෙස අතිරේක ලේකම් (නීති) අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය හා බන්ධනාගාර මෙහෙයුම් වෙතින් 2025.06.09 දිනැතිව ප්‍රකාශ සටහන් කර ගත් බවට 01 වන වගඋත්තරකරු කරුණු ඉදිරිපත් කර ඇත.

එහිදි සාක්ෂි ලබාදුන් බන්ධනාගාර කොමසාරිස් මෙහෙයුම් දක්වා ඇත්තේ ජනාධිපති නියෝග ප්‍රකාරව අනුමැතිය ලබාදී ඇති සිරකරුවන් පමණක් නිදහස් කළ යුතු බවට නියෝග මගින් බන්ධනාගාර අධිකාරිවරුන් දැනුවත් කළ බවයි. අතිරේක ලේකම් (නීති) අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙතින් සටහන් කර ගත් ප්‍රකාශ අනුව දක්වා ඇත්තේ ජනාධිපති බලතල අනුව පොදු සමාව ලබාදීමට අනුමැතිය ලබාදුන් සිරකරුවන්ට පමණක් එසේ පොදු සමාව ලබාදිය යුතු නමුත් 2024.12.25 දිනැති නත්තල් උත්සවය වෙනුවෙන් සිරකරුවන් 274 ක් සඳහා ලබාදී ඇති සමාවේදි හා 2025.05.12 දින වෙසක් උත්සවය වෙනුවෙන් සිරකරුවන් 338 ක් සඳහා ලබාදුන් සමාවේදීද එකී ලේඛනයේ හි ඇතුලත් නොවූ සිරකරුවන් නිදහස් කිරීමටද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ අනුදැනුම සහිතව බන්ධනාගාර අධිකාරිවරුන් කටයුතු කර ඇති බවට කරුණු නිරීක්ෂණය වන බවයි.

ඒ අනුව අත්අඩංගුවට ගැනීමට පෙර පැමිණිල්ලට අදාළව සාක්ෂි 2 ක් පමණක් සටහන් කර ඇති බවට නිරීක්ෂණය වන අතර, 01 වන වගඋත්තරකරු අත්අඩංගුවට ගැනීමට හේතුවූ කරුණු ලෙස දක්වා ඇති ඉහත කරුණු 03 සඳහා එම සාක්ෂි මගින් සාධාරණ කරුණු සැපයිමක් විමර්ශනයේදි ලැබි ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවේ. තවද බී වාර්තාවේ දක්වා ඇති වරදවල් සිදුකළ බවට 01 වන වගඋත්තරකරු දක්වා සිටියද එම වරදවල් වින්දිත සිදුකළ බවට විමර්ශනයක් වූ බවට කිසිදු ආකාරයක කරුණු හෙළිදරව්වක් කොමිෂන් සභාවේ අවධානයට ලක් නොවේ.

කෙසේ වෙතත් අදාළ ලේඛන පරික්ෂා කිරිමේදි මෙම රැඳවියා 2025.05.14 නිදහස් කිරිම සිදුකර ඇත්තේ අනුරාධපුර බන්ධනාගාරයෙන් බව අවධානයට ලක්වේ. එහිදි 2025.06.06 දින මෙම සිදුවීමට අදාළව මධ්‍යයේ පළවූ පුවතත් සමඟ 2 වන වගඋත්තරකාර පාර්ශවය වින්දිත වෙතින් කරුණු විමසූ බවට 2 වන වගඋත්තරකාර පාර්ශවය දක්වා ඇත. ඒ අනුව වින්දිත ඒ පිළිබඳව බන්ධනාගාර අධිකාරි මෙහෙයුම් මගින් අනුරාධපුර බන්ධනාගාර අධිකාරි වෙතින් වාර්තාවක් කැඳවා ඇති බවට වැඩිදුරටත් කරුණු නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවයට අනුරාධපුර බන්ධනාගාර අධිකාරි ලබාදි ඇති වාර්තාව හා අනුරාධපුර බන්ධනාගාර අධිකාරි එම රැඳවියා නිදහස් කිරිම පිළිබඳව මහාධිකරණයට යැවූ ලිපිය මත පදනම්ව 2 වන වගඋත්තරකරුට යවනු ලැබූ තොරතුරු වාර්තාව සකසා ඇති බවට වැඩිදුරටත් කරුණු නිරික්ෂණය වන අතර, එම ලිපියේ පිටපතක්ද වින්දිත 2 වන වගඋත්තරකරුට වැඩිමනක් යොමු කර ඇති බවද අවධානයට ලක්වේ.

ඒ අනුව වින්දිත තම දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් යොමුකරන ලද තොරතුරු මත පිහිටා එම ලේඛනය සකසා ඇති බව නිරීක්ෂණය වේ. තවද අනුරාධපුර බන්ධනාගාර අධිකාරි වෙතින් මහාධිකරණය විසින් අදාළ ප්‍රශ්නගත රැඳවියා නිදහස් වූ ආකාරය විමසා සිටිම මත මෙම තොරතුරම අනුරාධපුර බන්ධනාගාර අධිකාරි විසින් මහාධිකරණයටද ලබාදී ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

මෙම ජනාධිපති පොදු සමාව ලබාදීමට අදාළව බලය පැවරීම බන්ධනාගාර මෙහෙයුම් වෙත සිදුකර ඇති බව ලේඛන අනුව නිරීක්ෂණය වන අතර, බන්ධනාගාර මෙහෙයුම් විසින් මෙම ජනාධිපති සමාව ලබාදීමේ සමස්ථ ක්‍රියාවලියට අදාළව අභ්‍යන්තර චක්‍ර ලේඛන නිකුත් කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. පොදු සමාව නොලැබුනු අයෙකු නිදහස් කිරීම පිළිබඳව පරීක්ෂණයක් කලේ නම් මූලික අවධානය ඉහත කරුණු කෙරේ යොමු විය යුතු වුවද වගඋත්තරකාර පාර්ශවය අවධානය යොමුකර ඇත්තේ එම නිදහස් නොවිය යුතු බවට දක්වන රුදවියා නිදහස් වූ පසු සිදුවූ ක්‍රියාවලිය බව මානව හිමිකම් කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

කෙසේ වෙතත් 01වන වගඋත්තරකාර පාර්ශවය දක්වන පැමිණිල්ලේ දක්වා ඇත්තේ මෙම නිදහස්වීම වැරදි බවත් ඒ පිළිබඳ විමර්ශනය කරන ලෙසත්ය.

තවදුරටත් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම සිදුවීමට අදාළව අධිකරණයට කරුණු වාර්තා කළ බී වාර්තාවේ සඳහන් ව්‍යාජ හා අසත්‍ය ලේඛනවල පිටපත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 18 වන වගන්තිය ප්‍රකාර 2025.08.25 දිනැතිව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව 2025.09.19 දාතමින් ලිපියක් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ මෙම සිදුවීමට අදාළව අධිකරණයට කරුණු වාර්තා කළ ව්‍යාජ හා අසත්‍ය ලේඛන සම්බන්ධයෙන් රජයේ රස පරික්ෂකවරයා මගින් විශේෂඥ මතය ඇතුලත් විශ්ලේෂණ වාර්තා ලබාගත යුතුව ඇති බැවින් නිතිපති උපදෙස් ප්‍රකාරව මේ අවස්ථාවේ එකී ලේඛන කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බවයි.

තවද වින්දිත විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදුන් ප්‍රකාශයේ පිටපතක් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලෙසට 01 වන වගඋත්තරකරුට දැනුම් දුන්නද එහි අන්තර්ගත සම්බන්ධයෙන් කරුණු වැඩිදුර විමර්ශන සිදුකරමින් පවතින බැවින් නිතිපති උපදෙස් ප්‍රකාරව ඉදිරිපත් කළ නොහැකි බවට 01 වන වගඋත්තරකාර පාර්ශවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දන්වා ඇත.

එහිදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2025.10.30 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉහත කරුණු දක්වා ඇති අතර, මෙවැනි ලේඛන ලබානොදීම තුළින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවරී ඇති බලතල හා කර්තව්‍ය වන විමර්ශන පැවැත්වීමට එම කරුණු බාධාවක් වන බව වැඩිදුරටත් දක්වා ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 18 වගන්තිය ප්‍රකාරව ඉල්ලුම් කරන ලේඛන ලබා නොදීම වරදක් වන අතර,

මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව අපහාසය සම්බන්ධයෙන් දඩුවම් ලැබි ලැබිය හැකි වරදක් වේ.

ඒ අනුව නිරීක්ෂණය වන්නේ මෙම වින්දිතයා අත්අඩංගුවට ගැනීමට පාදකවූ ප්‍රධානතම ලේඛනය සත්‍ය/කූඨ ලේඛනයක්ද නැද්ද යන්න විමර්ශනය කිරීම වින්දිතව අත්අඩංගුවට ගැනීමෙන් පසුව සිදුකරනු ලබන බවයි. එසේම වින්දිතයා ලබාදී ඇති ප්‍රකාශය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකිරීමට හේතුව ලෙස දක්වා ඇත්තේ " එහි අන්තර්ගත කරුණු වැඩිදුරටත් විමර්ශනය කරමින් පවතින බැවින් "නීතිපති උපදෙස් මත ඉදිරිපත් කළ නොහැකි බවයි. ඒ අනුව නිරීක්ෂණය වන්නේ වින්දිතගේ ප්‍රකාශය පිළිබඳව තවදුරටත් විමර්ශනය වෙමින් පවතින බවයි. එසේ තිබියදි මෙම අත්අඩංගුවට ගැනීම තුළින් වින්දිතට අගතියක් සිදුවි ඇති බවට කරනු ලබන ප්‍රකාශය බැහැර කළ නොහැකි බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත් උක්ත කරුණු අනුව වින්දිත අත්අඩංගුවට ගනු ලැබුවේ මෙම ප්‍රකාශ හා අදාළ ලේඛන නිසි විමර්ශනයකට ලක් කිරීමෙන් පසුව නොවන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

මෙම සිද්ධියට හේතුවූ ජනාධිපති සමාව ලබාදෙනු ලබන ක්‍රියාවලිය පිළිබඳ අවධානය යොමු කිරීමේදි විශේෂිත අවස්ථාවලදි ලබාදෙනු ලබන මෙම පොදු සමාවේදි ඒ සඳහා සුදුසුකම් ලබන රැඳවියන්ට අදාළ නිර්ණායක ජනාධිපති කාර්යාලය මගින් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවට යොමු කරන බව නිරීක්ෂණය වේ. ඒ අනුව බන්ධනාගාර අභ්‍යන්තර චක්‍ර ලේඛනයක් මගින් ඒ පිළිබඳ සියලු බන්ධනාගාර වෙත යොමු කරන බව අවධානයට ලක්වේ. ඒ අනුව මෙම සිදුවීමට අදාළව 2025.05.01 වන දිනැතිව අභ්‍යන්තර චක්‍ර ලේඛනයක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) විසින් යොමුකර ඇති බව පෙනී යන අතර,. 2025.05.12 වන දිනට භෞතිකව නිදහස් වන යෝජිත ලැයිස්තුව සියලුම බන්ධනාගාර වෙතින් ලබාගෙන ඇති බවටද කරුණු නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම සිදුවීමට අදාළව ලේඛනයේ නොමැති රැඳවියෙකු නිදහස්වීමට අදාළව කරුණු විමර්ශනය කිරීමේදි අනුරාධපුර බන්ධනාගාර අධිකාරි විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදි ඇති ප්‍රකාශය කෙරේ අවධානය යොමු කරනු ලැබේ.

අනුරාධපුර බන්ධනාගාර අධිකාරි - එම්.එස්.මොහාන් කරුණාරත්න මයා වෙතින් 2025.12.19 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රකාශයක් ලබාගෙන ඇති අතර, එහි දක්වා ඇත්තේ මෙම සිදුවීම සම්බන්ධයෙන් බන්ධනාගාරයෙන් 2025.05.01 දින නිකුත් කළ අභ්‍යන්තර චක්‍ර ලේඛනයට අදාළව 2025.05.12 වන දින භෞතිකව නිදහස් වන රැඳවියන් පමණක් ලේඛන ගත කළ බවයි. එහෙත් මෙම කොන්දේසි යටතේ සුදුසුකම් ලබන රැඳවියන් 174 දෙනෙකු 2025.05.13 සිට 2025.06.06 දින දක්වා දිනයන්හිදි බන්ධනාගාර ආයතන 28 කින් නිදහස්ව ගොස් ඇති බවත් තවත් 1516 කට මෙම කොන්දේසි යටතේ එම හිමිකම ලද බවට ලේඛනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

එහිදි දක්වා ඇත්තේ සමාව පිරිනැමීම මත නිදහස් කිරිමට සුදුසුකම් ලබන යෝජිත ලැයිස්තුවක් මුලින් ඉදිරිපත් කලද එම ලැයිස්තුව ඉදිරිපත් කළ දිනය හා සමාව ලබාදෙනු ලබන දිනය ලෙස නම් කල දිනය අතර, කාලය තුළ බන්ධනාගාර ගතවන අදාළ කොන්දේසි සපුරා ඇති රැඳවියන් ද උක්ත කරුණ යටතේ සමාව ලැබීමට සුදුසුකම් ලබන බැවින් එම කාලසීමාවට අදාළ රැඳවියන්ද පසුව නිදහස්වීමට සුදුසුකම් ලබන බවයි.

මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදි 2025.05.12 දිනට භෞතිකව නිදහස් වන සිරකරුවන් පමණක් නාම ලේඛනයට ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, 2025.05.11 දිනැති බන්ධනාගාර අභ්‍යන්තර චක්‍ර ලේඛනය මෙන්ම ඊට පාදක වු ජනාධිපති ලේකම් කාර්යාලයේ නිර්ණායක පිළිබඳ අවධානය යොමු කිරීමේදි 2025.05.05 වන විට සිටි රැදවියන් සියලු දෙනාටම මෙම ලබාදී ඇති නිර්ණායක අදාළ වන හෙයින් එම නිර්ණායක සපුරන්නේ නම් ඔවුන්ගේ නිදහස ලබන දිනයන් වෙනස් වන බවද කරුණු නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම ආකාරයට බන්ධනාගාරය විසින් පෙර සිටම මේ ආකාරයට අදාළ දිනයට භෞතිකව නිදහස් වන අයට අමතරව එම නිර්ණායක සපුරා පසුව නිදහස් වන රැදවියන් ඇති බවත් මෙම පරිචය අනාදිමත් කාලයක සිට පිළිගත් ක්‍රමවේදය තුළ පුරුදු පුහුණු කර ඇති බවද නිරීක්ෂණය වේ. ඒ බව සනාථ වනුයේ නත්තල් දිනයට අදාළව යෝජිත ලැයිස්තුවේ නොමැති අය නිදහස් කිරිම පිළිබඳව 2024.12.17 හා 2024.12.18 දිනයන්හිදි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් නිකුත් කළ ලිපි පිළිබඳ අවධානය යොමු කිරිමේදි 2024.12.17 ලිපියේ "ඇමුනුමේ සඳහන් සිරකරුවෙකු නාමලේඛනයට ඇතුලත් වු සිරකරුවන්ට අමතරව කිසිදු සිරකරුවෙකු නිදහස් නොකරන ලෙස" දැක්විමෙන් පසුව 2024.12.18 ලිපියෙන් එම කරුණු ඉවත් කර තිබිම මගින් එම කරුණු තවදුරටත් සනාථ වෙයි. ඒ අනුව 02 වන වගඋත්තරකාර පාර්ශවයද එම පරිචය පිළිගෙන ඇති බවද කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

එහිදි ප්‍රශ්නගත වු රැදවියා නිදහස් වීම පිළිබඳ අවධානය යොමු කිරීමේදි පෙනීයන්නේ මෙම රැඳවියාට මහාධිකරණය මගින් රු.20,000/- දඩයක්ද රුපියල් ලක්ෂ 20 ක වන්දි මුදලක් ගෙවීමට නියම කර තිබු බවත් එම දඩය නොගෙවන්නේ නම් ලක්ෂ 20 ක වන්දියකට විකල්ප දඩුවමක් ලෙස මාස 06 ක බරපතල වැඩ සහිත සිරදඩුවම් නියම කර තිබු බවත් ඒ අනුව මොහු අදාළ දඩ මුදල ගෙවීමට භාර ගෙන තිබුනද එම දඩ මුදල නෙගෙවිම මත මාස 06 ක සිරදඩුවමට බන්ධනාගාර ගත කර ඇති බවත්ය. ඔහුට දඩුවම පමුණුවා ඇත්තේ මහාධිකරණය මගින් දණ්ඩ නීති සංග්‍රහයේ 386 වගන්තිය යටතේ බව කරුණු නිරීක්ෂණය වන අතර, අදාළ 2025.05.11 වන දින බන්ධනාගාරය වෙතින් නිකුත් කල K06/විශේෂසමා/වාර්තා/05-12/2025 හා 2025.01.01 දිනැති චක්‍ර ලේඛනයේ කොන්දේසි 2 ක එනම් 2025.05.05 වන විට භෞතිකව බන්ධනාගාරයේ සිටිම හා දඩය අහෝසි විම යන කොන්දේසි මෙම සැකකරු සම්පූර්ණ කර ඇත.

එහෙත් වෙනත් නඩුවකට මෙම රැදවියා බන්ධනාගාර ගත වී සිටි බැවින් ඉහත කොන්දේසි සපුරා එම නිදහසට හිමිකම් ලැබුවද නැවත ඔහු "නිදහස් රක්ෂිත බන්ධනාගාර ගත වීම්" හේතුවෙන් 2025.05.12 දින නිදහස්වයාමේ අවකාශ ලැබි නොමැති බවද අවධානයට ලක්වේ. පසුව 2025.05.14 දින අධිකරණ නියෝග මත ඇප අත්සන් කිරීම මත නිදහස්ව පිටව ගොස් ඇති බවට කරුණු ආනාවරණය වේ.

ඒ අනුව මේ දක්වා පැවැති ක්‍රමවේදය තුළ මෙම රැඳවියා නිදහස්ව ගොස් ඇති බවට වැඩිදුරටත් කරුණු නිරීක්ෂණය වේ. බන්ධනාගාර අභ්‍යන්තර චක්‍ර ලේඛන අංක - k 06/01/05-12/2021 හා 2025.05. දින රහිත ලිපිය අනුව මෙම රැඳවියා අදාළ මුලින් බන්ධනාගාරය විසින් යොමුකළ ලේඛනයේ ඇතුලත් නොවී ඇත්තේ ඔහුට මෙම නිදහස ලබා ගැනීමට හිමිකම ලබා ගැනීමට හිමිකම තිබුනද තවත් නඩුවක් තිබූ නිසා භෞතිකව 2025.05.12 දිනට නිදහස නොලැබෙන නිසා බව කොමිෂන් සභාව සභාවේ අවධානයට ලක්වේ. මෙම ගැටළුව මතුවී ඇත්තේ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති නිදහස් කිරීම පිළිබඳව චක්‍ර ලේඛ සකස්කර ඇති නිර්ණායක මගින් මෙම ගැටළුව ආමන්ත්‍රය කිරීමේ ක්‍රමවේදයක් එතුල නොමැති විමනිසා බවද කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

එසේ බන්ධනාගාර ආඥාපනතේ මෙම රැඳවියන් නිදහස් කිරීම ඇතුලු සියලුම කටයුතු පිළිබඳ බලධරයා වනුයෙන් බන්ධනාගාර ජේලර්වරයා වන අතර, ඉහලම නිලධරයා ලෙස කොමසාරිස් ජනරාල්වරයා අධීක්ෂණ රාජකාරි සිදුකරනු ලබයි.

තවද මෙම "ජනාධිපති පොදු සමාව යටතේ නත්තලට සමගාමීව 2024.12.25 දිනට අදාළව යෝජිත සිරකරුවන් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් නිදහස් කිරීම පිළිබඳව" විමර්ශනය සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් පත්කල කමිටුවේ 2025.05.28 දිනැති වාර්තාවේ පහත නිරීක්ෂණ දක්වා ඇත.

<u>කමිටුවේ නිරීක්ෂණ සහ නිර්දේශ</u>

70) ඉහත සඳහන් තත්ත්වයන් සලකා බැලීමෙන් අනතුරුව කමිටුව විසින් පහත සඳහන් නිරීක්ෂණ සිදුකරයි.

අ) "2024 නත්තල" නිමිත්තෙන් සමාව ලබාදීම සඳහා අනුමගමනය කරන ලද නිර්ණායක සම්ප්‍රදායික පිළිවෙත් මත පදනම් වී ඇති අතර නීතියට, ක්‍රියාපටිපාටිවලට නුකූලව විෂය මූලිකව සලකා බැලීමක් සිදුකර නැත. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද නීති විද්‍යාත්මක කරුණු සලකා බැලීමක්, නීතියට, සහ කෙසේ වෙතත් අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කමිටු සාමාජික) එන්.ධනසිංහ මහතා විසින් මෙම කමිටුවේ අවධානයට යොමුකළ පරිදි, පොදු සමාවක් ලබාදීමෙදි මෙම නිරීක්ෂණය ප්‍රායෝගික දෘෂ්ඨි කෝණයකින් බැලිය යුතුය.

ආ) ඉහත (අ) නිරීක්ෂණය අනුව වරදකරුවන් වූ සිරකරුවන් 332 දෙනෙකු නිදහස් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් 2025.01.23 දිනැති C11 ලිපියට අනුව පසුව අනුමත කිරීම නොතකා නිසි සලකා බැලීම අවශ්‍ය වනු ඇත.

ඇ) මෙම සන්දර්භය තුළ, සිරකරුවන් නිදහස් කරන අවස්ථාවේදී හෝ නිදහස් කිරීමට පෙර ප්‍රකාශිත අනුමැතියක් නොමැති බව යන කරුණ සඳහා නිසි සලකා බැලීමක් අවශ්‍ය බව සටහන් කළ යුතුය.

ඇ) සිරකරුවන් 332 දෙනෙකු නිදහස් කිරීමට නියමිතව තිබියදී සිරකරුවන් 389 දෙනෙකු පසුව නිදහස් කිරීම සහ අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) විසින් වරදකරුවන් වූ සිරකරුවන් 332 දෙනාගේ ලැයිස්තුවෙන් පිටත කිසිදු සිරකරුවෙකු නිදහස් නොකරන ලෙස ලබාදුන් නිශ්චිත නියෝගය ද සලකා බැලිය යුතුය.

ඉ) අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට මුලින් යවා ඇති වරදකරුවන් වූ සිරකරුවන් 332 දෙනෙකුගේ මූලික ලැයිස්තුව පසුව 389 ක් දක්වා වැඩි වී ඇති අතර, මුල් ලැයිස්තුවේ තිබූ නම් 43 ක් මගහැරී ඇති බව කමිටුව නිරීක්ෂණය කර ඇත. තවද පසුව ලැයිස්තුවට සිරකරුවන් 99 දෙනෙකු එකතු කිරීමට ඇති පදනම ද ඒ අනුව සලකා බැලිය යුතුය.

71) තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව වරදකරුවන් ලෙස හඳුනාගත් සිරකරුවන්ට අනාගතයේදි ජනාධිපති සමාව ලබා දීම සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුව තීරණය කර ඇත.

අ) 2023 අංක 10 දරණ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය වීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ පනත යටතේ ඇති වගකීම් ඇතුලුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන සහ අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූල වරදකරු වූ සිරකරුවෙකුට සමාවක් ලබාදීම සලකා බැලීම සඳහා ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කළ යුතුය.

ආ) ජනාධිපති සමාවක්/සිරදඬුවම් අඩු කිරීමක්/සහනයක් හෝ දඬුවමක් අත්හිටුවීම සඳහා සලකා බැලීමට සුදුසු පුද්ගලයින්ගේ ලැයිස්තුවක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම සඳහා නිසි නීතිමය ක්‍රියා පටිපාටියක් (සලකා බැලිය යුතු වෛෂයික නිර්ණායකයක් ඇතුලුව)

ඒ අනුව ඉහත කමිටුව මගින්ද හඳුනාගෙන ඇත්තේ මම ජනාධිපති පොදු සමාව යටතේ රැඳවියන් නිදහස් කිරීම සම්ප්‍රදායික පිළිවෙතක් මත හේතු වි ඇති බවයි.

එමගින් නිරීක්ෂණය වනුයේ ජනාධිපති සමාව ලබාදීම සඳහා නියමිත ක්‍රියා පටිපාටියේ දෝෂයක් මත එලෙස රැඳවියන් අදාළ දිනයට නිදහස් වන අතරම කොන්දේසි සැපිරූ අය පසු අවස්ථාවල තවද වින්දිත එම කමිටුවටද එලෙස යෝජිත නාම ලේඛනයට වඩා රැඳවියන් නිදහස් වීමට හේතුව කුමක්ද යන්න 2025.04.08 දිනැති ලේඛනය මගින් පැහැදිලි කර ඇත.

ඒ අනුව එම සියලු කරුණු විමර්ශනය කලේ නම් වින්දිත අත්අඩංගුවට ගැනීමට හේතුවක් නොවනු ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

පොදු සමාව යටතේ රැඳවියන් නිදහස් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වන අතර, එසේ පොදු සමාව යටතේ නිදහස් වීමට අදාළ නිර්ණායක සම්පූර්ණ කරන රැඳවියන්ගේ ලේඛනය ජනාධිපතිතුමා වෙත යොමු කිරීම සිදු කෙරේ.

එසේම මෙසේ නිදහස්වීමට අදාළ ලේඛනය ජනාධිපතිතුමාට යොමු කර අනුමැතිය ලබාදෙන කාලය අතරතුර ඉහත නිර්ණායක සම්පූර්ණ කරන රැඳවියන් සිටින අතර, පරිචයක් ලෙස එකී රැඳවියන්ද නිදහස් කිරීම මීට පෙර අවස්ථාවලදී තිබී ඇති බව නිරීක්ෂණය වී ඇත.

මෙසේ සුදුසුකම් ලබන කණ්ඩායමක් නිදහස් වීමට තිබූ අවස්ථාව අහිමි වුයේ නම් ඔවුන් වෙනස්කමකට භාජනය වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) උල්ලංඝනයක් සිදුවිය හැකි බවද නිරීක්ෂණය වේ.

මෙහි සිදුවී ඇත්තේ සුදුසුකම් ලබන සියලු රැඳවියන් නිදහස් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමේදි ඇතිවූ ගැටලුවක් බව නිරීක්ෂණය වන අතර, එය නිවැරදි කර ගත යුතුව ඇති බව නිරීක්ෂණය වන අතර ඒ බව අධිකරණ අමාත්‍යාංශය විසින් පත්කළ කමිටු නිර්දේශයේ (ඉහතින් සඳහන් කර ඇති) 7(1)(අ) නිර්දේශය මගින් වඩාත් තහවුරුවේ.

ඒ අනුව මෙම වින්දිත සම්බන්ධවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලද පැමිණිල්ලක් අනුව අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත. එම පැමිණිල්ල කෙරේ අවධානය යොමු කිරීමේදි මුල් පැමිණිල්ලේ දක්වනුයේ බන්ධනාගාරය වෙතින් නිදහස් නොවිය යුතු රැඳවියෙකු නිදහස් කිරීම බරපතල වරදක් බැවින් ඒ පිළිබඳ පරීක්ෂණ කරන ලෙසයි. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ සිදුකර ඇත්තේ එම රැඳවියා නිදහස් වූ පසු ඊට අදාළව ප්‍රශ්න කිරීම මත සකස් කළ ලේඛන බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වරයා පිළිබඳව බව නිරීක්ෂණය වේ.

තවද වින්දිත විසින් 01 වන වගඋත්තරකාර පාර්ශවය ලබාදුන් ප්‍රකාශය නිසි ලෙස විමර්ශනය සිදුකරේ නම් වින්දිත අත්අඩංගුවට ගැනීමට සාධාරණ හේතුවක් නොවන බව කොමිෂන් සභාව අවධානයට ගනී ඒ බව වඩාත් තහවුරු වනුයේ වින්දිත කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශ හා ලේඛන අධ්‍යනයේදි මෙන්ම, 01 වන වගඋත්තරකාර ආයතනයට වින්දිත ලබාදුන් ප්‍රකාශය කොමිෂන් සභාවට ලබාදිම ප්‍රතික්ෂේප කිරිම තුළිනි.

වින්දිතගේ ප්‍රකාශ හා අනිකුත් ලේඛන පිළිබඳ ප්‍රමාණවත් පරිදි විමර්ශනය කිරීමකින් තොරව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළ බව නිරීක්ෂණය වේ. ඒ අනුව සාධාරණ පැමිණිල්ලකින් තොරව හා/හෝ නිසි විමර්ශනයකින් තොරව අත්අඩංගුවට ගැනීම අත්තනෝමතික වේ. ඒ බව පහත නඩු තීන්දු වලින්ද තහවුරු කෙරේ.

<u>**වන්න පිරිස් ඒ නීතිපති [1994] 1 Sri LR 1**</u> මෙම නඩුවේදි විනිසුරු දක්වන ලද්දේ සැකය හුදු සැකයක් නොව සාධාරණ මනුෂ්‍යයකු ලෙස දැකිය හැකි සාධාරණ සැකයක් වරෙන්තු වක් නොමැතිව පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමේදි පැවතිය යුතු බවයි. ඒ අනුව මෙම වින්දිත අත්අඩංගුවට ගැනීමේදි සාධාරණ පැමිණිල්ලක් මත අත්අඩංගුවට ගැනීම සිදුකලාද යන්න සලකා බැලිය යුතුය.

<u>ගනේෂන් සැම්සන් රෝයි ඒ.එම්.එම්.ජනක මාරසිංහ හා තවත් අය</u> (SCFR 405/2018) නඩුවේදී දක්වා තිබුනේ යම් පුද්ගලයකු තනිකරම ආත්මිය හේතූන් මත හෝ සාමාන්‍ය හෝ පැහැදිලි සැකයක් මත සිදුකරන ලද අත්අඩංගුවට ගැනීමක් අත්තනෝමතික වනු ඇති බවයි. තවද එහිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ දක්වා තිබුනේ පොලිසියට ලැබුනු පැමිණිල්ලක් මත පමණක් පොලිස් නිලධාරින්ට යාන්ත්‍රිකව සැකකරුවෙක්ව අත්අඩංගුවට ගත නොහැකි අතර, චෝදනාව විශ්වාසදායක බවට මතයක් ගොඩනගා ගත නොහැකි නැතහොත් සපයන ලද තොරතුර විශ්වාසදායකද යන්න පිළිබඳව කරුණු පැහැදිලි නොවේ නම් එය තහවුරු කර ගැනීමට අවශ්‍ය පරීක්ෂණ පොලිස් නිලධාරියෙකු කළ යුතු බවයි.

<u>වලහන්ගුණ වැව ධර්මරත්න හිමි ඒ සංජීව මහානාම **SCFR 313/09 SCM**</u> 03 July 2013 නඩුවේද දක්වා සිටියේ

" In order to arrest a person under this sub section (Section 32 of Criminal Procedure Code Act No of 1979 there should a reasonable complaint, credible information or a reasonable suspicion. Mere fact of receiving a complaint or information does not permit a peace officer to arrest a person. A police officer upon receipt to a complaint or information is required to commence investigations and ascertain whether the complaint is a reasonable complaint, the information is credible or the suspicion is reasonable before proceeding to arrest.

A person the fact that a complaint was made is not itself a ground to arrest a person. Anyone can falsely implicate another person. A peace officer should be satisfied that it is a reasonable complaint.

තවද වින්දිත දක්වා සිටින කරුණක් වන්නේ තමා රක්ෂිත බන්ධනාගාර ගත කර සිට නැවත අධිකරණයට ඉදිරිපත් කර ඇප ලබා ගැනීමට ඉල්ලුම් කලද කිසිදු සාධාරන හේතුවක් නොමැතිව දින 29 ක කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේදි 01 වන වගඋත්තරකාර පාර්ශවය හා 2 වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුව තමා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ව නොසිටි කාලවල සිදුවීම්ද දක්වමින් ඇප ලබාදීමට විරුද්ධ වූ බවයි. ඒ තුළින් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව තමාව රක්ෂිත බන්ධනාගාර ගතවීම හේතුවෙන් කායික, මානසික පීඩාවට ලක්වූ බවය.

එලෙස කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව රක්ෂිත බන්ධනාගාර ගත විම හේතුවෙන් පුද්ගලයෙකුට සිදුවන කායික මානසික ආතතිය කිසිදු ආකාරයකින් ප්‍රතිපූර්ණය කිරීමේ හැකියාව නොමැත. එබැවින් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම ඉතාමත් කල්පනාකාරිව සිදුකළ යුතු කටයුත්තක් වනු ඇත. ඒ බව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මගින් තහවුරු කර ඇත.

දයානන්ද එ විරසිංහ හා තවත් අය [ (1983) 2 Sri LR 2 Sri LR 84 at 92 ] හිදි දක්වා ඇත්තේ

"Magistrates Should be more vigilant and comply with the requirements of the law when making remand orders and not act as mere rubber stamps"

එසේම රණවක ආරච්චිගේ ගාමිණී ජයරත්න හා තවත් අය එ ස්ථානාධිපති අරලංගවිල පොලිස් ස්ථානය හා තවත් අය SCFR 346/2018 (තීරණය කලේ 2025 ජුලි 03) නඩුවේදි දක්වා ඇත්තේ සැකකරුවන් රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා පොලිසිය විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් (කාර්යක්ෂමව ක්‍රියා නොකර) විචක්ෂණශීලී තිරණ ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මහේස්ත්‍රාත්වරුන් දැනුවත් වී තිබීමේ අනිවාර්ය අවශ්‍යතාවය මෙම අධිකරණය සටහන් කර සිටින බවයි. ඇප පනත මගින් පිළිගත් පරිදි පාලන මූලධර්මය නම්, ඇප ලබාදීම සාමාන්‍ය නීතිය වන අතර, ඇප ලබාදීම ප්‍රතික්ෂේප කිරීම ව්‍යාතිරේකය විය යුතු බවයි. සැකකරුවෙකුට ඇප ලබාදීම ප්‍රතික්ෂේප කර ඔහු රිමාන්ඩ් භාරයේ තැබීමට මහේස්ත්‍රාත්වරයෙකුට නීත්‍යානුකූලව හැකි වුවද ඔහු එසේ කළ යුත්තේ හුදෙක් පොලිසියේ ඉල්ලීම මත පමණක් නොව, අපරාධ යුක්තියේ අරමුණුවලට අනුකූලව පවතින වලංගු හේතුන් මතය. ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අධිකරණයද බැඳී සිටින බවත්, නීතියෙන් පිළිගත් වලංගු හේතුන් මත, සුවිශේෂී අවස්ථාවන්හිදි පමණක් එවැනි අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සීමා කරන නියෝග නිකුත් කළ යුතු බවත්, නීතියට අනුකූලව එවැනි තීරණ ගත යුතු බවත් මහේස්ත්‍රාත්වරුන් මනා ලෙස දැනුවත්විය යුතුය. මෙම තීන්දුවේ අන්තර්ගත මූලධර්ම පිළිබඳව මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට විනිසුරුවන්ගේ ආයතනය අවශ්‍ය පියවර ගනු ඇතැයි මෙම අධිකරණ අපේක්ෂා කරන බව දක්වා ඇත.

මෙම වින්දිත අත්අඩංගුවට ගැනීමේදි නිසි විමර්ශනයක් කර ඇති බව නොපෙනෙනවා මෙන්ම එම කරුණු නිවැරදිව හා ප්‍රමාණවත් ලෙස මහේස්ත්‍රාත් අධිකරණ වෙත ඉදිරිපත් කර ඇති බවක් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණයය නොවේ.

ඒ අනුව 01 වන වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත නීතියේ දක්වා ඇති කාර්යය පටිපාටිය අනුව අත්අඩංගුවට ගැනීම සිදුකර නොමැති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

මීලගට වින්දිත සම්බන්ධව නිතියේ රැකවරණය සර්ව සාධාරණව නොලැබුනු බවට දක්වන කරුණු කෙරේ අවධානය යොමු කිරීමේදි වින්දිත දක්වා සිටිනුයේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කල තමාගේ වැඩතහනමට ලක් කිරීම නිසි ක්‍රියා පටිපාටිය අනුව සිදු නොකළ බවයි.

වගඋත්තරකාර පාර්ශවය මෙහිදි දක්වා සිටිනුයේ වෙසක් පොහෝය දිනට සමගාමීව ජනාධිපති පොදු සමාව යටතේ බන්ධනාගාර රැඳවියන් නිදහස් කිරීමේ ක්‍රියවලිය තුළ පැන නැගි ඇති ගැටලු යන මැයෙන් 2025.06.09 දිනැතිව දන්වා එවන ලද අමාත්‍ය මණ්ඩල තිරණය ප්‍රකාරව ආයතන සංග්‍රහයේ 11 වෙනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ

31:5:1 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගනිමින් වහාම ක්‍රියාත්මක වන පරිදි බන්ධනාගාර කොමසාරිස් ජනරාල් එච්.එම්.ටී.එන්.උපුල්දෙණිය මහතාගේ රාජකාරි වැඩ තහනම් කළ බවයි.

එහිදී වගඋත්තරකාර පාර්ශවය තවදුරටත් දක්වා සිටිනුයේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා අමාත්‍යාංශය වෙත හා මාධ්‍ය වෙත කරුණු දැක්වීමට පෙර ලේඛන පරීක්ෂා කිරීමකින් තොරව තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් ඔහු නොසැලකිලිමත්ව කටයුතු කළ බවයි. ඒ අනුව ඒ පිළිබඳ අධිකරණය හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙත දන්වා සිටින ලද අවස්ථාවේදී ඒ පිළිබඳව ජනාධිපති ලේකම් වෙත දැන්වීමට කටයුතු කරන ලෙස කල දැනුම්දීමෙන් අනතුරුව ජනාධිපති ලේකම් කාර්යාලය දැනුවත් කළ බවත් පසුව 2025.06.06 දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින්,

01. ජනාධිපතිතුමන් විසින් පොදු සමාව යටතේ වෙසක් දිනයට සමගාමීව නිදහස ලබාදීම සඳහා අනුමැතිය ලබාදී නොතිබුනු ඩබ්.එම්.අතුල තිලකරත්න නම් රුදවියා සම්බන්ධයෙන් වැරදි තොරතුරු අධිකරණයට වාර්තා කිරීම සහ,

02 එම තොරතුරු මත පදනම්ව නිදහස් කළ රුදවියා නිදහස් කිරීම සාධාරණීකරණය කරමින් කරුණු දැක්වීම යන ක්‍රියාවන්ට එරෙහිව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ඇතුලු අනෙකුත් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස 2025.06.07 දින දැන්වූ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

ඒ අනුව එම උපදෙස් මත පිහිටා 2 වන වගඋත්තරකාර පාර්ශවය 2025.06.09 දාතමින් ඉදිරිපත් කර ඇති කැබිනට් පත්‍රිකාව පිළිබඳ අවධානය යොමු කිරීමේදී වින්දිත පිළිබඳව කැබිනට් මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා 2 වන වගඋත්තරකරු නිර්දේශ ලිපියක් සකස් කර ඇති බව නිරීක්ෂණය වේ. 2025.06.09 දින යෝජනා කළ එම පත්‍රිකාවේ justification තුල

- නිදහස් කළ රුදවියාගේ නම එම අදාළ ලේඛනයේ තිබූ බවට කරුණු තහවුරු කර නොගැනීම හා පරීක්ෂා නොකිරීම.
- බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා අත්සන් කළ ලේඛනයේ රුදවියාගේ නම නොතිබුනු බවට අනාවරණය කර ගැනීමට නොහැකිවීම.
- ඔහුගේ නොසැලකිලිමත් ක්‍රියාව තුළ මහජන සේවය අපකීර්තියකට පත් කිරීම.

- පොහොය දින මුලින්ම ඉදිරිපත් කළ සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සිරකරුවන් නිදහස් කිරීම සිදුවූ පසුබිමක 2024 නත්තල් දින පොදු සමාව යටතේ රුදවියන් 332 අනුමැතිය දී ඇති අවස්ථාවක රුදවියන් 389 ක් නිදහස් කිරීම පිළිබද පැහැදිලි කිරීමක් කැදවා ඇති බව දක්වා ඇත.

ඒ අනුව උක්ත 02 වන වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කළ පත්‍රිකාව තුළ වින්දිත සැබැදිව හා සිදුවූ සිදුවීම් පිළිබඳව නිසි කරුණු ප්‍රමාණවත්ව හා නිසි ලෙස ඉදිරිපත් කළ බවට කරුණු නිරීක්ෂණය නොවේ.

තවද වින්දිත දක්වා සිටිනුයේ තම වැඩතහනමට ලක් කිරිමට පෙර ආයතන ප්‍රධානියා වු තමාගෙන් කිසිදු අවස්ථාවක ඒ පිළිබඳව නිදහසට කරුණු විමසිමක් නොකල බවයි.

වින්දිත දක්වා සිටිනුයේ මෙම රුදවියෙකු නිදහස් කිරීම පිළිබඳව දෙවන වගඋත්තරකරු Whatsapp මගින් විමසිම අනුව අනුරාධපුර බන්ධනාගාර අධිකාරි වෙතින් එදිනට වාර්තාවක් කැදවා එම වාර්තාව පදනම් කොට ගෙන ඒ පිළිබඳව 2025.06.06 දින 14.40 ට 2 වන වගඋත්තරකරු වෙත යොමුකළ බවයි. ඒ අනුව ලබාදී ඇති ලේඛන අනුව එම කරුණු තහවුරු වේ.

එලෙස ලබාදුන් වාර්තාවට අනුව මාධ්‍ය නිවේදනය නිකුත් කිරිමෙන් අනතුරුව ඒ පිළිබඳව රාත්‍රි 10.00 ප්‍රවෘත්ති වල විකාශය විම පිළිබඳව වින්දිත විසින් 02 වන වගඋත්තරකරු වෙත වට්ස්අප් මගින් යොමු කර ඇති අතර, එම Whatsapp පණිවිඩය සඳහා Noted ලෙස සටහන් කොට 02 වන වගඋත්තරකරු අවධානය යොමුකර ඇති බවටද ලේඛන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව 2 වන වගඋත්තරකරු විසින් මෙම වින්දිත එම්.එම්.ටී.එන්.උපුල්දෙණිය නිවැරදි ලේඛන පරීක්ෂා නොකර කටයුතු කළ බවට 2025.06.06 දින ජනාධිපති ලේකම් වෙත ලිඛිතව යොමුකිරිමත්, එදිනම රාත්‍රි 10.00 ට වැරදි ලෙස ප්‍රචාරය කළ බව දක්වන මාධ්‍ය කරුණු වින්දිත විසින් 2 වන වගඋත්තරකරු යොමු කිරීමේදි Noted ලෙස දක්වා අවධානයට ගෙන තිබිමත් ප්‍රශ්න ගත වේ. ඒ වන විට ලැයිස්තුවේ නොමැති රුදවියෙකුට සමාවදී තිබේ නම් ඒ පිළිබද මාධ්‍ය ප්‍රචාරය නිවැරදි කිරීම හෝ වින්දිත වෙතින් විමසීමක් සිදුකිරීමේ හැකියාව තිබුනද ඒ පිළිබඳව 2 වන වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. වින්දිත මෙම සිදුවිමේදි ආයතන ප්‍රධානියෙකු ලෙස කටයුතු කලේද යන්න සලකා බැලීමේදි වින්දිත මාධ්‍යයේ පලවු සිරකරුවෙකු නිදහස් කිරීම පිළිබඳව බන්ධනාගාර මෙහෙයුම් විසින් අනුරාධපුර බන්ධනාගාර අධිකාරි වෙතින් කරුණු විමසිමට දන්වා එම තොරතුරු කැදවා ඇත.

ඒ අනුව අනුරාධපුර බන්ධනාගාර අධිකාරි විසින් යොමුකරන ලද වාර්තාව හා බන්ධනාගාර අධිකාරි අනුරාධපුර මහාධිකරණයට 2025.06.04 දාතමින් යොමුකළ ලිපියද අදාළ කරගෙන සකස් කරන ලද වාර්තාවක් මගින් 02 වන වගඋත්තරකරුට වාර්තා කර ඇති බවද කරුණු අනාවරණය වේ.

ඒ අනුව විකාශය වූ කරුණු සියල්ලම 2025.06.06 දින 2 වන වගඋත්තරකරුට සන්නිවේදනය කර තිබියදි එම මාධ්‍ය කරුණු නිවැරදි නොවේ නම් එය නිවැරදි නොකර නිදහස් කළ රැඳවියාගේ නම ලැයිස්තුවේ නොමැතිවීම පිළිබඳ වින්දිත වෙතින් විමසීමක් නොකර 2025.06.06 දිනට ජනාධිපති ලේකම් වෙත කරුණු වාර්තා කිරිම ප්‍රශ්න සහගත වේ. එසේම වින්දිත පාර්ශවය විසින් අදාළ මාධ්‍ය නිවේදනය රාත්‍රී 10.00 ට ප්‍රවෘත්ති විකාශනයෙහි ප්‍රචාරය වූ බවට 02 වන වගඋත්තරකරුට Whatsapp මගින් දැනුම්දීමේදි 02 වන වගඋත්තරකරු විසින් එය Noted ලෙස පිළිගැනීම තුළ 2025.06.06 දින මෙම කරුණු සියල්ල කඩිනමින් ජනාධිපති ලේකම් වෙත යොමු කරන ලද්දේ 02 වන වගඋත්තරකාර පාර්ශවය විසින් කරුණු නිවැරදිව අනාවරණය කොට ගෙනද යන ප්‍රශ්නය පැන නගී. තවද වින්දිත වැරදි තොරතුරක් මාධ්‍යයට ලබාදුන්නේ නම් 02 වන වගඋත්තරතාර පාර්ශවය අධික්ෂණ නිලධාරි ලෙස ඒ පිළිබඳ වින්දිත වෙතින් කරුණු විමසීමක් සිදු කිරිමට පැහැදිලි අවස්ථාව තිබියදි ඒ පිළිබඳ කටයුතු නොකර හදිසි අවස්ථාවක මෙන් කටයුතු කිරිමද කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

එසේම වින්දිත විසින් 2025.06.07 දිනට අනුරාධපුර බන්ධනාගාර අධිකාරි සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදුකරන ලෙස දක්වා ඇති බවට අදාළ ලේඛන පරීක්ෂා කිරීමේදි කරුණු නිරීක්ෂණය වේ.

ඒ අනුව වින්දිත ආයතන ප්‍රධානි ලෙස තම නිලධාරීන් වෙතින් වාර්තා කැඳවා එම තොරතුරු ලබාදී ඇති අතර, මෙම සමස්ථ ක්‍රියාවලිය තුලට ආයතන ප්‍රධානි විසින් ඔහුගේ බලතල අභිනියෝජනය කර තිබියදි පැමිණිලිකරු වැඩ තහනමකට ලක් කිරීම ප්‍රශ්න ගතවේ.

එසේම ආයතන ප්‍රධානියකු වූ වින්දිත වෙතින් කරුණු විමසීමකින් තොරව මෙම රැඳවියන් නිදහස් කිරීම පිළිබඳ ක්‍රියාවලිය පිළිබඳව අනවබෝධයෙන් වින්දිතගේ වැඩ තහනමට ලක් කිරීම ප්‍රශ්නගත වන අතර, ඒ අනුව 02 වන වගඋත්තරකාර පාර්ශවය අදාළ කැබිනට් පත්‍රිකාව සඳහා යොමුකරන ලද නිර්දේශ ලිපිය නිසි කරුණු අධ්‍යානයකින් සිදුකර ඇතිද යන්න ගැටළු සහගත වේ.

එසේම මෙහිදි ප්‍රශ්නගත වනුයේ ලේඛනයේ සඳහන් නොවන පුද්ගලයකු නිදහස් කිරීම තුළ ඇති වූ තත්ත්වය වන අතර, ඒ පිළිබඳ පැහැදිලි කිරිම කිරීමේදි අදාළ ලේඛන පරීක්ෂා නොකිරිමද දෙවනුව මතුවන ගැටළුවකි.

එසේම මෙම ලේඛනයන් සියල්ලම 02 වන වගඋත්තරකාර පාර්ශවය වෙත යොමු වී තිබුනද ඒ පිළිබඳව ඔවුන්ද එම ලේඛන හා කරුණු පරීක්ෂාකාරි වූයේ වින්දිත පරීක්ෂාකාරි වූ අවස්ථාවේම බවට කරුණු නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම වින්දිත සම්බන්ධව 02 වන වගඋත්තරකරු ගත් ක්‍රියාමාර්ග ගනු ලැබුවේ නිසි කරුණු අධ්‍යානයකින්ද යන්න

ගැටළු සහගත වේ.. 2025.06.09 වන දිනැති 02 වන වගඋත්තරකාර පාර්ශවය යොමු කළ ලිපියේ නොසැලකිලිමත් ලෙස "බන්ධනාගාර කොමසාරිස්" ගේ වැඩතහනමකට ලක්කරන බව දක්වා ඇත. පසුව එය 2025.06.13 දිනැතිව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ලෙස නිවැරදි කර අත්සන් කර ඇති බවටද කරුණු නිරීක්ෂණය වේ.

ඒ අනුව වින්දිත සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවයන් සාධාරණ ලෙස ක්‍රියාත්මක වුවාද යන ගැටලුව පැන නැගින අතර, වින්දිතට ඒ පිළිබඳ කරුණු දැක්වීමට නිසි අවස්ථාවක් ලබා නොදී අනවශ්‍ය කඩිනමින් කටයුතු කිරීම තුළ අත්තනෝමතික භාවයක් නිරීක්ෂණය වේ.

ඒ තුළින් වින්දිත නිතියෙන් දක්වා ඇති රැකවරණය අහිමිවීම තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වූ බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

සමස්ථ කරුණු අනුව වින්දිත සැබැදිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මෙන්ම 13(1) ව්‍යවස්ථාවද උල්ලංඝනය කර ඇති බැවින් පහත නිර්දේශයන් සිදුකරනු ලැබේ.

**නිර්දේශ**

01 පොලිස්පතිවරයා හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් පළවන වගඋත්තරකරුගේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධව පරීක්ෂා කොට සුදුසු පියවර ගත යුතු අතර, අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හා නීතිමය ප්‍රතිපාදන දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට සියලු නිලධාරින්ට චක්‍ර ලේඛනයක් මගින් යළිත් දැනුම්වත් කළ යුතුය.

02. ඉහත කරුණු අනුව වැඩතහනම් කිරිමේ ක්‍රියාවලියේදි නීතිමය හා පරිපාලනමය වශයෙන් වින්දිත වන එච්.එම්.ටී.එන්.උපුල්දෙණිය මහතාගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වන බැවින් එම සියලු කරුණු සලකා 02 වන වගඋත්තරකරු විසින් වින්දිත සම්බන්ධව සුදුසු පියවර ගතයුතු අතර, ගනු ලබන එම පියවර සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දීමට පියවර ගත යුතුය.

2026..04..30...... වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුට වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත -

01. අමාත්‍යතුමා,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක - 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
— අවශ්‍ය පියවර ගැනීම සඳහා

02. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.
— අවශ්‍ය පියවර ගැනීම සඳහා

03. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.
— අවශ්‍ය පියවර ගැනීම සඳහා

04. ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල
— අවශ්‍ය පියවර ගැනීම සඳහා